ජාතික සමගිය හා ප්‍රතිසංධානය සඳහා වන කාර්යාලය 2024 අංක 01 දරණ පණත මගින් පිහිටුවන ලද ආයතනයක් වන අතර උක්ත කාර්යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ගිණුම් නිළධාරී — තනතුරු සංඛ්‍යාව : 01

සේවා ගණය : **JM 1-1**

## තනතුරෙහි ස්වභාවය

- ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය වාර්තා පිළියෙල කිරීම හා විගණනයට ඉදිරිපත් කිරීම.
- සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම, රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභාවට අදාළ කටයුතු, ඒවා සම්බන්ධ පොත්පත්, ලේඛන පවත්වාගෙන යාම.
- සියලුම් මූල්‍ය සැළසුම් (මු.රේ. 135 යටතේ බලතල පැවරීම, ප්‍රසම්පාදන සැළසුම්) පිළියෙල කිරීම, සංශෝධනය කිරීම හා අනුමැතිය ලබා ගැනීම.
- වැටුප් ඇතුලුව සියලුම ලැබීම් හා ගෙවීම් වව්චර් පරීක්ෂාව.
- සේප්පු භාරව කටයුතු කිරීම.
- බැංකු සැසඳුම් පරීක්ෂාව.
- දේශීය ආදායම්බදු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වාර්තා නිසි පරිදි සකස් කිරීම.
- පාලක මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු වාර්තා පිළියෙල කිරීම හා අමාත්‍යාංශයට ඉදිරිපත් කළ යුතු විවිධ වාර්තා පිළියෙල කර ඉදිරිපත් කිරීම.
- චෙක්පත් වල දෙවන අත්සන් කරුවෙකු ලෙස ක්‍රියා කිරීම.
- මුදල් අංශයේ සාමාන්‍ය දෛනික පරිපාලන හා කාර්යාලීය කටයුතු.
- රාජ්‍ය පරිපාලන භාණ්ඩාගාර හා රේඛීය අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන චක්‍රෙල්ඛ වෙන් වෙන් ව ගොනු පවත්වාගෙන යාම.
- අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීම.

## සුදුසුකම් (පහත 1 හෝ 2)

1. විශ්ව වද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගණකාධිකාරණය/වාණිජ්‍ය/ව්‍යාපාර පරිපාලනය හෝ තනතුරට අදාළ විෂයය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

2. තනතුරට අදාළ ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත්, වරලත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම

## වයස් සීමාව

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

---

## වැටුප් පරිමාණය

**JM 1-1 – 2025 - රු. (72,650 - 10 x 1,360 - 18 x 2,040 - 122,970)**

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)